ගිරිබාව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 24 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 නොවැම්බර් 28 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ගිරිබාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 2012 ජූලි මස සිට 2012 ඔක්තෝබර් මස දක්වා කාලය වෙනුවෙන් 2013 මාර්තු මස ලද රු.673,850 ක උසාවි දඩ ලැබීම් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබීම නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ). 2012 ජූලි මස සිට 2013 දෙසැම්බර් මස දක්වා වූ කාල පරිච්ඡේදයට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබූ අතර, 2011 වර්ෂය වෙනුවෙන් හා 2012 ජනවාරි මස සිට ජූනි මස දක්වා කාල පරිච්ඡේදය සඳහා 2013 වර්ෂයේ ලද රු.918,803 ක මුද්දර ගාස්තු ආදායම වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ). 2012 කුට්ටිගල් ඇතිරීමේ කර්මාන්ත සඳහා කොන්ත්‍රාත්කරු ගෙන් අයකර ගැනීමේ පදනම මත සභාව විසින් ගෙවා කර්මාන්තකරු ගෙන් අයකරගනු ලැබූ රු.182,027 ක තත්ත්ව පරික්ෂණ ගාස්තු, වැටුප් හා දීමනා වියදම් තුල දැක්වීම නිසා වර්ෂයේ වැටුප් හා දීමනා වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා ඒ සඳහා අයකරනු ලැබූ මුදල් ප්‍රාග්ධන ආදායම් යටතේ දැක්වීම මත වර්ෂයේ ආදායමද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 පැහැදිලි නොකල වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර වත්කම්වල වටිනාකම රු.18,462,982 ක් වුවද, ඊට අනුරූපීව පැවතිය යුතු ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමෙහි ශේෂය රු.17,565,602 ක් වූයෙන් රු.897,380 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ). 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.36,236,726 ක් විය. ඒයින් රු. 2,275,503 ක් වර්ෂ 1කට වඩා පැරණි ශේෂයන් වූ අතර, 1,718,388 ක ශේෂය සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් නොවුණි.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.37,807,211 ක් වූ අතර, ඒයින් රු. 4,216,277 ක් වසර 1කට වඩා පැරණි ශේෂයන් විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්ථන වියදම රු.130,582 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,083,976 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.38,214,558 ක පිරිහීමක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.37,268,725 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.35,328,785 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රතිඵලය රු.1,809,358 ක අතිරික්තයක් බවට පත්වී තිබුණ.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ). සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.19,918,810 න් සියයට 84 ක් ලෙස රු.16,726,445 ක් උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.37,268,725 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.20,049,393 ක් වූ අතර ඉන් රු.13,639,962 ක් පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර ඉන් සියයට 88 ක් ලෙස රු.12,085,594 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම රු.35,328,784 ක් වූ අතර ඉන් සියයට 2 ක් ලෙස රු.649,213 ක් පමණක් සභා අරමුදල් වැය වී තිබුණු අතර, ඉතිරි සියයට 98 ක් වූ රු.34,679,571 ක මුදල වෙනත් ආයතනවල ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන් සඳහා වැය වූ මුදල් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, කඩකුලී, බදුකුලී වැනි ආදායම්, ක්ෂේත්‍රයේදී එකතු කිරීම සඳහා නිශ්චිත බලයක් නොතිබුණද, සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම වරිපනම් බදු හා වෙළඳ බලපත්‍ර වැනි ආදායම්ද ක්ෂේත්‍රයේදී එකතු කර තිබුණි.

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.208,000 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 වත්කම් කළමනාකරණය

රු.151,000 ක් වටිනා ගැලුම් 800 ක ජල බවුසරයක් වසර 06 ක පමණ කාලයක සිට නිශ්ක්‍රීයව පැවති අතර පොත් වටිනාකම රු.1,750 ක් වූ රෝනියෝ යන්ත්‍රයක්ද රු.126,500 ක් වූ ඡායා පිටපත් යන්ත්‍රයක් ද රු.200,000 ක් පමණ වූ වන්නි කුඩාවැව බෙහෙත් ශාලාවද වසර කිහිපයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අයවැය ලේඛනමය පාලනය

පුනරාවර්තන වැය රු.1,624,000 ක් සහ ප්‍රාග්ධන වැය රු.32,048,000 ක් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවා වැයකර තිබුණි.

5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). මූල්‍ය පාලනය

(ඇ). ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය